# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**10 ශ්‍රේණිය**

## නර්තනය - II

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2යි

**පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01)

i. කොහොඹා කංකාරියේ තරඟකාරී වාදනයක් ලෙස දැක්වෙන්නේ ................................ වාදනයන් ය.

ii. උඩරට නර්තනයේ දී භාවිතා කරන කස්තිරම සබරගමු නර්තන සම්ප්‍රදායේ දී .............................. ලෙස හඳුන්වයි.

iii. නව වන ගොඩ සරඹයේ සරඹ නාමය ............................. ලෙස නම් කරනු ලබයි.

iv. "දොං දොං ජිං ජිං ගජිගත" මෙම බෙර පදය මාත්‍රා ................. තාල රූපයට වාදනය කළ හැකිය.

v. කුවේණියගේ විලාපය කියවෙන ගායනා ඇතුළත් වන්නේ ...................... නර්තන අංගයේ ය.

vi. ග්‍රහපන්ති කවි ගායනය කරනු ලබන්නේ .............................. ශාන්තිකර්මයේ දී ය.

vii. "සිංහල නර්තන කලාව" නම් කෘතිය රචනා කරන ලද්දේ ................................. මහතා විසිනි.

viii. සිංහල ජන නැටුමේ එන ලී මල්ලිය දෙමළ ජන නැටුමේ දී ........................... නමින් හඳුන්වයි.

ix. භරතමුණි හා නන්දිකේශ්වර විසින් රචිත කෘති දෙක ලියන්න.
a) භරතමුණි ............................. b) නන්දිකේශ්වර ........................

x. "මල් ගවසන්නී කොණ්ඩය ගොතා හෙලන්නී" මෙම කවි පදය අයත් වන
a) ගැමි නාටකය ......................... b) චරිතය ...........................

02)

i. මාත්‍රා 2+3 දෙතිතට බෙර පදයක් ප්‍රස්තාර කරන්න.
ii. මාත්‍රා 3+3 මැදුම් තිතට අයත් ගැමි කවියක් ප්‍රස්තාර කරන්න.
iii. මාත්‍රා 2+4 දෙතිතට අයත් අඩව්වක් ලියන්න.

(ලකුණු 4x3=12)

03) පහත සඳහන් මාතෘකා අතරින් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

i. අවකාශ භාවිතය
ii. දෙතිතේ ප්‍රභේද
iii. අංගරචනය
iv. දළදා පෙරහැර
v. ගැමි නැටුම්
vi. එස්. පණීභාරත මහතා

(ලකුණු 4x3=12)

04)

i. නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු අනාවරණය කරගත හැකි මූලාශ්‍ර තුනක් නම් කරන්න. (ල 3)

ii. නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බවට වංශ කතාවක් ඇසුරින් සාධකයක් ඉදිරිපත් කරන්න. (ල 4)

iii. දේශාඨන වාර්තාවක් ඇසුරෙන් ආගමික හා සමාජීය අවශ්‍යතා සඳහා නර්තනය යොද ගැනීම පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල 5)

05)

i. සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු දෙකක් ලියා චරිත දෙකක් නම් කරන්න. (ල 4)

ii. සොකරි රංග භූමිය පිළිබඳ විස්තරයක් කරන්න. (ල 4)

iii. සොකරි නාටකයේ ගායනය හා වාදනය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ල 4)

06)

i. දේශීය ශාන්තිකර්ම තුනක් නම් කර ඒවා පැවැත්වීමේ අරමුණු තුනක් ලියන්න. (ල 6)

ii. සමාජ සාරධර්ම වර්ධනයට ශාන්ති කර්මයන්ගේ දයකත්වය පිළිබඳ කරුණු තුනක් යටතේ පැහැදිලි කරන්න. (ල 6)

07) ජීවිතයේ යහ පැවැත්මට බලපාන සමාජ සාරධර්ම දේශීය නර්තන කලාව හා බැඳී පවතී.

i. පන්ති කාමරයේ ගුරුවරයා සහ සිසුන් අතර පවතින සාරධර්ම විස්තර කරන්න. (ල 4)

ii. ශාන්තිකර්මයක් කිරීමේ දී අනුගමනය කරන සමාජ සාරධර්ම හතරක් ලියන්න. (ල 4)

iii. රූපවාහිනී නර්තන නිර්මාණයන්හි රංග වස්ත්‍රාභරණ හා නර්තන නිර්මාණ දේශීය අනන්‍යතාවයට බලපාන අයුරු විස්තර කරන්න. (ල 4)